නාවලපිටිය පාසලක ශිෂ්‍යාවන්ගෙන් ආදරය ඉල්ලා නිතර හිරිහැර කිරීම සම්බන්ධයෙන්, එම පාසලේම සිසුන් තිදෙනෙකු තරුණයන් පිරිසකගෙන් කරුණු විමසීමේදී ඇතිවූ ගැටුමක් හේතුවෙන් 7 දෙනෙකු තුවාල ලබා රෝහල්ගත කිරීමේ පුවතක්, මාධ්‍ය අවධානයට යොමු වී තිබිණි.
ඒ පිළිබඳව ලංකාදීප, දිනමිණ සහ දිවයින පුවත්පත් (මාර්තු 10, 2023) තොරතුරු වාර්තා කර ඇත්තේ මේ අයුරිනි.
*ලංකාදීප - පාසලේ නම සඳහන් නොකරයි.
* දිවයින - පාසලේ නම සඳහන් නොකරයි.
* දිනමිණ - පාසලේ නම සඳහන් කරයි.
1) ඔබ සිතන ලෙසට, මෙම පුවතට පාසලේ නම සඳහන් කිරීම අත්‍යවශ්‍ය ද?
2) දිනමිණ පුවත දෙස බැලූ විට, පාසලේ නම සඳහන් නොකර වුවත් මෙම පුවත ඉදිරිපත් කළ නොහැකිද? ඔබේ අදහස?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

